# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2248/62 - 2021 ඔක්තෝබර් මස 08 වැනි සිකුරාදා - 2021.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 2/2017.

**1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත**

1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කාංචන විජේසේකර,
විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන්
ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින
ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය
අමාත්‍ය.

කොළඹ දී ය.

1A - PG 5571 - 1520 (2021/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නියෝග

1. මෙම නියෝග 2021 විශේෂිත ව්‍යාධිජනකයින්ගෙන් තොර පසු කීටයන් නිපදවීමේ නියෝග යනුවෙන් හැඳින්වේ.

2. මෙම නියෝග ශ්‍රී ලංකාවේ කිවුල්දිය ඉස්සන් අභිජනනාගාර සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

3. ශ්‍රී ලංකාවේ යම් කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු විසින් විශේෂිත ව්‍යාධිජනකයින්ගෙන් තොර මව් ඉස්සන් භාවිත කිරීමෙන් පමණක් කිවුල්දිය ඉස්සන් අභිජනනය කිරීමේ නිරත විය යුතු ය.

4. කිවුල්දිය ඉස්සන්ගේ නෝප්ලියා අවස්ථාවේ සිට පසු කීට අවස්ථාව දක්වා පමණක් වර්ධනය කරනු ලබන යම් කිවුල්දිය ඉස්සන් අභිජනනාගාර ඒකකයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු විසින් විශේෂිත ව්‍යාධිජනකයින්ගෙන් තොර ඉස්සන්ගේ නෝප්ලියාවන් පමණක් ලබා ගෙන එකී නෝප්ලියාවන් පසු කීට අවස්ථාව දක්වා වර්ධනය කළ යුතු ය.

5. ජලජීවී වගාව සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා යම් ඉස්සන් බෝකිරීමෙහි නියැලී සිටින ඉස්සන් අභිජනනාගාරක ඇති විශේෂිත ව්‍යාධිජනකයින්ගෙන් තොර යම් මව් ඉස්සන්, බිත්තර, නෝප්ලියාවන් සහ පසු කීටයන් ඇතුලු කීට අවස්ථා හැර අන් සියලු මව් ඉස්සන්, බිත්තර, නෝප්ලියාවන් සහ පසු කීටයන් ඇතුළු කීට අවස්ථා තහනමට ගැනීමේ සහ විනාශ කිරීමේ බලය ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධරයකු හට ඇත්තේ ය.

6. මෙම නියෝගවල -

"කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරය" යන්නෙන්, කිවුල්දිය ඉස්සන්ගේ පසු කීටයන් හෝ නෝප්ලියාවන් නිපදවනු ලබන ස්ථානයක් අදහස් වේ;

"නෝප්ලියා" යන්නෙන්, ඉස්සකුගේ පළමුවන කීට අවස්ථාව අදහස් වේ;

"පසු කීටයන්" යන්නෙන්, විකිණීම පිණිස නිපදවනු ලබන කීට අවස්ථා ඉස්සන් අදහස් වේ;

"විශේෂිත ව්‍යාධිජනකයින්ගෙන් තොර" යන්නෙන්, මව් ඉස්සන් සංවර්ධනය කිරීම සඳහා පමණක් විශේෂයෙන් සකස් කරන ලද මධ්‍යස්ථානයක වරණීය අභිජනනය මගින් මෙම නියෝගවල නිශ්චිතව සඳහන් කිවුල්දිය ඉස්සන්ට වැළඳෙන රෝග කාරක රහිතව නිපදවන මව් ඉස්සන් අදහස් වේ. මෙම ඉස්සන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් විශේෂිත ව්‍යාධිජනකයින්ගෙන් තොර බවට සහතික කරනු ලැබිය යුතු ය.

10 - 314

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.